“අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන්ගේ කාලයේ ආහාර සාඃ එකක් හෝ අක්ත් හෙවත් කැටි කිරි හා රට ඉඳිවලින් පිසූ ආහාර වර්ගයෙන් සාඃ එකක් හෝ බාර්ලි සාඃ එකක් හෝ රට ඉඳි සාඃ එකක් හෝ මිදි සාඃ එකක් හෝ ලොකු පොඩි, නිදහස් හා වහලුන් සියලු සෑම දෙනා වෙනුවෙන්ම අපි සකාතුල් ෆිත්ර් නිකුත් කරන්නන් ලෙස සිටියෙමු

අබූ සඊද් අල් හුඃද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන්ගේ කාලයේ ආහාර සාඃ
එකක් හෝ අක්ත් හෙවත් කැටි කිරි හා රට ඉඳිවලින් පිසූ ආහාර වර්ගයෙන් සාඃ එකක් හෝ බාර්ලි සාඃ එකක් හෝ රට ඉඳි සාඃ එකක් හෝ මිදි සාඃ එකක් හෝ ලොකු පොඩි, නිදහස් හා වහලුන් සියලු සෑම දෙනා වෙනුවෙන්ම අපි සකාතුල් ෆිත්ර් නිකුත් කරන්නන් ලෙස සිටියෙමු. මුආවියා ඉබ්නු අබී සුෆ්යාන් (රළියල්ලාහු අන්හු) තුමා හජ් ඉටු කරන්නෙකු හෝ උම්රා ඉටු කරන්නෙකු ලෙස අප වෙත පැමිණෙන තෙක් අපි එයින් බැහැර නොවූයෙමු. එවිට හෙතෙම මින්බර් වේදිකාවේ සිට ජනයා ඇමතුවේය. ඔහු ජනයාට ඇමතූ කරුණු අතර මෙසේ පවසා සිටියේය: ශාම් දේශීය ධාන්ය වර්ග මුද්දු දෙකක් රට ඉඳි සාඃ දෙකකට සමාන වන්නේය. එවිට ජනයා ද එය පිළිපදින්නට ගත්තෝය. අබූ සඊද් තුමා මෙසේ පවසයි: මා ජීවත්ව සිටින
තාක්කල් එවක මා නිකුත් කරමින් සිටියාක් මෙන්ම දිගටම මම නිකුත් කරමින් සිටිමි.
[صحيح] [متفق عليه]

මුස්ලිම්වරු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ කාලයේ මෙන්ම එතුමාණන්ගෙන් පසු කුලෆාඋර් රාෂිදීන් හෙවත් ප්රධාන පාලකයන් සිව් දෙනාගේ කාලයේ ද ලොකු පොඩි සෑම කෙනෙකු වෙනුවෙන්ම ආහාර සාඃ එකක ප්රමාණයක් සකාතුල් ෆිත්ර් නිකුත් කරමින් සිටියහ. ඔවුන්ගේ ආහාර වූයේ බාර්ලි, වියලි මිදි මෙන්ම කැටි කිරි හා රට ඉඳි වලින් පිසූ අක්ත් හෙවත් ආහාර වර්ගය. සාඃ එකක ප්රමාණය මුද්දු හතරකි. මුද්දු යනු සාමාන්ය මිනිසෙකුගේ දෝත පිරෙන ප්රමාණයකි. කලීෆා වරයකු ලෙස මදීනාවට මුආවියා (රළියල්ලාහු අන්හු) තුමා පැමිණි කල්හි, සිරියාවේ තිරුගු අධිකව පැවතුනි. එතුමා දේශනයක් කරමින් මෙසේ පැවසූහ: ශාම් දේශීය ධාන්ය වර්ග මුද්දු දෙකක්, රට ඉඳි සාඃ දෙකකට සමාන වන බව මම සිතමි. එවිට ජනයා ද එය පිළිපදින්නට ගත්තෝය. අබූ සඊද් අල්-කුද්රි (රළියල්ලාහු අන්හු) තුමා පවසා සිටියේ: මා ජීවත්ව සිටින තාක්කල් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ කාලයේ මා නිකුත් කරමින් සිටියාක් මෙන්ම දිගටම මම නිකුත් කරමින් සිටිමි.

http://www.sunnah.global/hadeeth/si/show/4454